**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 2 සේවා ගණයේ නිෂ්පාදන බදු නිලධාරි තනතුර සඳහාවන උසස්කිරීමේ පටිපාටිය**

1. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා රේගුව
යොමු අංකය :AB/3B/නිබනි/විවිධ  දිනය :2024.05.21

1.2 අමාත්‍යාංශය : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති
යොමු අංකය : MF1/02/01/CUS/42(i)  දිනය : 2024.06.04

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/1173-II  දිනය :2016.04.01
යොමු අංකය: DMS/1173-Vol.V  දිනය:2023.02.15

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2/03/REC/10034  දිනය :2024.04.17

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/05-01-02-04/2019  දිනය:2025.03.24

2. **පත්කිරීමේ බලධරයා:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්

3. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : ක්ෂේත්‍රගත/ කාර්යාලගත ඛණ්ඩ - 2

3.2. ශ්‍රේණි :II, I

3.3. **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :**

තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වශයෙන් කිසියම් පනතක්/ ආඥා පනතක්/ ප්‍රඥප්තියක් මගින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ/ නියාමනය කිරීමේ/ විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස අවශ්‍ය වන්නා වූ ද සේවා ගණයකි.

3.4 **කාර්යයන් පැවරීම :**

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

4. **තනතුරුවල ස්වභාවය :** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

md

## 5. වැටුප:

5.1. වැටුප් කේත අංකය : MN5 - 2016

5.2. මාසික වැටුප් පරිමාණය : රු.34,605-10x660-11x755-15X930-63,460

5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | පියවර 01 | 34,605 |
| I | පියවර 12 | 41,960 |

## 6. සේවා ගණයට අයත් තනතුර / තනතුරු:

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත 1990 අංක 40 දරණ සංශෝධිත පනත ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |
|---|---|---|---|
| නිෂ්පාදන බදු නිලධාරි | II / I ශ්‍රේණිය | 20 | 1. නිෂ්පාදන බදු ගෙවිය යුතු ආයතන හඳුනාගැනීම හා එම ආයතන ලියාපදිංචි කර ගැනීම.<br>2. නිෂ්පාදන බදු අය කර ගැනීම.<br>3. නිෂ්පාදන බදු ගෙවන ආයතන වල බදු ලිපිගොනු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.<br>4. නිෂ්පාදන බදු විශේෂ විධි විධාන පනත යටතේ නිකුත් කරනු ලබන ගැසට් නිවේදන වලට අනුව අදාළ කටයුතු යාවත්කාලීන කිරීම.<br>5. නිෂ්පාදන බදු නිසි පරිදි ගණනය කිරීම හා හිඟ බදු තක්සේරු කර බදු හා දඩ ගණනය කර අයකර ගැනීමට කටයුතු කිරීම.<br>6. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හා නිෂ්පාදන බදු අධ්‍යක්ෂ විසින් විටින් විට පවරන ලද රාජකාරී ඉටු කිරීම.<br>7. නිෂ්පාදන බදු ගෙවිය යුතු ආයතන අධීක්ෂණය කිරීම හා බදු අපගමනයන් වැළැක්වීමට පියවර ගැනීම.<br>8. බදු නොගෙවන හා ලියාපදිංචි නොවන ආයතන වලට එරෙහිව නීතිමය පියවර ගැනීම.<br>9. නිෂ්පාදන බදු ගෙවනු ලබන ආයතනවල පූර්ණ කාලීන චක්‍රීය ක්‍රමයට අධීක්ෂණ කටයුතු වල නියැලීම.<br>10. නිෂ්පාදන බදු ගෙවිය යුතු භාණ්ඩ වර්ග හඳුනා ගැනීම හා එම යෝජනා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීම.<br>11. පුවත්පත් දැන්වීම් මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා ආදිය මගින් බදු ගෙවිය යුතු ආයතන හා අදාල තොරතුරු රැස්කර ගැනීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : නිෂ්පාදන බදු නිලධාරි - 13

සටහන: ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

MA

7. බඳවා ගැනීමේ ක්‍රමය :
මෙම තනතුර දරන්නන්ට පමණක් පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

8. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය: ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 01) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? අවම වශයෙන් වසරකට වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?
රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

9. භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම :
10.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 10ක් උපයාගෙන තිබීම.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය:
සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය: සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි: අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ: අදාළ නොවේ.

mq

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛන මගින් ලබා දී ඇති MN-05-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. ඒසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

<u>**MN – 05 – I ශ්‍රේණිය**</u>

MN – 05 – 2016 පරිමාණයේ II ශ්‍රේණියට අදාළ තනතුරක් හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහය උපයාගෙන ඇති නිලධාරීන් MN – 05 – I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරණු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන: අදාල නොවේ.

සකස් කළේ: අත්සන..........................
(විෂය භාර කාණ්ඩ මාණ්ඩලික නිලධාරියා
නම : ඩී.ඒ.ඒ.යූ. ගුණසේකර
තනතුර : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (මා.ස.ක.)
දිනය : 2025.04. 04

පරීක්ෂා කළේ : අත්සන ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ශ්‍රීනි කරුණාරත්න
තනතුර : අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මා.ස.)
දිනය : 2025.04. 07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : පී.බී.එස්.සී. නෝනිස්
තනතුර : රේගු අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව :

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
"රේගු මන්දිරය"
අංක 40, කෙළින් වීදිය, කොළඹ 11

දිනය : 2025.04. 07

**18.** අමාත්‍යාංශ නිර්දේශය:

යොමු අංකය : MFI/02/01/CVS/42(i)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.03.24 දින අනුමත කරන ලද ශ්‍රී ලංකා රේගු ~~අමාත්‍යාංශයෙහි~~/ දෙපාර්තමේන්තුවෙහි **ක්ෂේත්‍රගත/ කාර්යාලගත බණ්ඩ - 2** සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]

නම :

ලේකම්

(අදාළ අමාත්‍යාංශ ලේකම්)

දිනය : 2024.06.04

කේ.එම්.මහින්ද සිරිවර්ධන
නිල මුද්‍රාව : මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

**19.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය : PSC/EST/05-01-02/04/2019

ශ්‍රී ලංකා රේගු ~~අමාත්‍යාංශයෙහි~~/දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී - බණ්ඩ 2 සේවා ගණය සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.03.24 දින අනුමත කරන ලදී.

අත්සන : [signature]

නම : ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2025.05.27

නිල මුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

ඇමුණුම 1

01. විභාගයේ නම: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන බදු නිලධාරී තනතුර - (ක්ෂේත්‍රගත/ කාර්යාලගත ඛණ්ඩ - 2 සේවා ගණය) තනතුරේ I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බදු ප්‍රතිපත්ති හා බදු පරිපාලනය | පැය 03 | 100 | 40 |
| බදු නීතිය හා රටේ සාමාන්‍ය නීති (සිවිල් අපරාධ) | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා: විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: අවම වශයෙන් වසරකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බදු ප්‍රතිපත්ති හා බදු පරිපාලනය | විශේෂයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බදු ප්‍රතිපත්ති හා බදු පරිපාලනයත්, අනෙකුත් බදු ක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය |
| බදු නීතිය හා රටේ සාමාන්‍ය නීති (සිවිල් අපරාධ) | සිවිල් හා අපරාධ නීති |

සකස් කළේ: ..............................

නම : ඩී.ඒ.ඒ.යූ. ගුණසේකර

තනතුර : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රේගුව, කොළඹ 11.

දිනය : 2025/04/04

පරීක්ෂා කළේ : ..............................

නම : ශ්‍රිනි කරුණාරත්න

තනතුර : අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්), ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11.

දිනය : 2025/04/07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(ආයතන ප්‍රධානියා)

නම : ..............................

තනතුර : ..............................

දිනය : 07.04.2025

නිල මුද්‍රාව : රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව, "රේගු මන්දිරය", අංක 40, කෙලින් වීදිය, කොළඹ 11